*සැ. යු.-* 2016.09.15 දින පළ වූ අංක 1985 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළනොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,986 - 2016 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.09.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1880 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1888 |


*සැ. යු.-* රාජිත කොඩිතුවක්කු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජූනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ඔක්තෝබර් මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1877- B 81100— 5,403 (2016/09)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩද-ාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෙ-ාජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරී-මෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේ-වකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ඔක්තෝබර් මස 24 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 අගෝස්තු මස 29 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | කරන්දෙනිය | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ කරන්දෙනිය පනාපිටිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

09-742

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ඔක්තෝබර් මස 24 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 අගෝස්තු මස 29 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | මැදදුම්බර | මැදදුම්බර කොට්ඨාසයේ තෙල්දෙණිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

09-741

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම්කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ඔක්තෝබර් මස 24 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 සැප්තැම්බර් මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | ලුණුගල | ඔයපළාත නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වියළුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |
| බදුල්ල | පස්සර | ඔයපළාත බටහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වියළුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

09-789

---

**බුද්ධශාසන අමාත්‍යාංශය**

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ බෞද්ධ විශ්වකෝෂයේ ප්‍රධාන කර්තෘ තනතුර, නියෝජ්‍ය කර්තෘ තනතුර සහ සහකාර කර්තෘ තනතුර

බෞද්ධ විශ්වකෝෂයේ ප්‍රධාන කර්තෘ තනතුර, නියෝජ්‍ය කර්තෘ තනතුර සහ සහකාර කර්තෘ තනතුර යන තනතුරුවල පවතින පුරප්පාඩුවලට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් එක් එක් තනතුරට වෙන් වෙන් ව අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් මත තමන් විසින් ම පිළියෙල කරගත් අයදුම්පත් 2016.10.23 වැනි දිනට හෝ ඊට පෙර ලේකම්, බුද්ධශාසන අමාත්‍යාංශය, ''දහම්පාය'', 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*සටහන.-* ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. කල්වේලා ඇති ව තම අයදුම්පත ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු ය.

(01) *බෞද්ධ විශ්වකෝෂයේ ප්‍රධාන කර්තෘ තනතුර* :

01. මෙම තනතුර තාවකාලිකය. ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකමක් නොමැති වසර දෙකක් (02) සඳහා කොන්ත්‍රාත් පදනම මත වූ තනතුරකි.

02. *වැටුප් ක්‍රමය.-* කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව මෙම තනතුරට අදාළ වැටුප් පහත පරිදි හිමි වේ.

| | | |
|---|---|---|
| 2016 - | මූලික මාසික වැටුප | = රු. 44,639.00 |
| | ගැලපුම් දීමනාව | = රු. 9,467.00 |
| | ජීවන වියදම් දීමනාව | = රු. 7,800.00 |
| 2017 - | මූලික මාසික වැටුප | = රු. 54,021.00 |
| | ගැලපුම් දීමනාව | = රු. 1,345.00 |
| | ජීවන වියදම් දීමනාව | = රු. 7,800.00 |

03. *වයස් සීමාව.-* අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක පාලි, බෞද්ධ සංස්කෘතිය පිළිබඳ I වැනි / II වැනි පෙළ ගෞරව උපාධියක් ලබා තිබීම හා එම ක්ෂේත්‍රයන් හි ආචාර්ය හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම; සහ

(ii) කෝෂ ග්‍රන්ථ කාර්යාලයක කෝෂ ග්‍රන්ථකරණය පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්ද; සහ

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනීමක් ලබා තිබීම.

05. *සේවා කොන්දේසි.-* ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සහ 12 වගන්ති අදාළ වේ.

06. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව තනතුරට අදාළ රාජකාරි සම්බන්ධව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සමඟ සේවා ගිවිසුමකට එළඹිය යුතුය.

(02) *බෞද්ධ විශ්වකෝෂයේ නියෝජ්‍ය කර්තෘ තනතුර :*

01. මෙම තනතුර තාවකාලිකය. ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකමක් නොමැති වසර දෙකක් (02) ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වූ තනතුරකි.

02. *වැටුප් ක්‍රමය.-* කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව මෙම තනතුරට අදාළ වැටුප් පහත පරිදි හිමි වේ.

| | | |
|---|---|---|
| 2016 - | මූලික මාසික වැටුප | = රු. 36,659.00 |
| | ගැලපුම් දීමනාව | = රු. 9,551.00 |
| | ජීවන වියදම් දීමනාව | = රු. 7,800.00 |
| 2017 - | මූලික මාසික වැටුප | = රු. 44,269.00 |
| | ගැලපුම් දීමනාව | = රු. 2,889.00 |
| | ජීවන වියදම් දීමනාව | = රු. 7,800.00 |

03. *වයස් සීමාව.-* අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක පාලි, බෞද්ධ සංස්කෘතිය පිළිබඳ I වැනි/ II වැනි පෙළ ගෞරව උපාධියක් ලබා තිබීම සහ පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධියක් ලබා තිබීම; සහ

(ii) කෝෂ ග්‍රන්ථ කාර්යාලයක කෝෂ ග්‍රන්ථකරණය සම්බන්ධව වර්ෂ 08 ක පළපුරුද්දක් තිබීම; සහ

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනීමක් ලබා තිබීම.

05. *සේවා කොන්දේසි.-* ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සහ 12 වගන්ති අදාළ වේ.

06. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව තනතුරට අදාළ රාජකාරි සම්බන්ධව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සමඟ සේවා ගිවිසුමකට එළඹිය යුතුය.

(03) *බෞද්ධ විශ්වකෝෂයේ සහකාර කර්තෘ තනතුර :*

01. මෙම තනතුර තාවකාලිකය. ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකමක් නොමැති වසර දෙකක් (02) ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වූ තනතුරකි.

02. *වැටුප් ක්‍රමය.-* කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව මෙම තනතුරට අදාළ වැටුප් පහත පරිදි හිමි වේ.

| | | |
|---|---|---|
| 2016 - | මූලික මාසික වැටුප | = රු. 27,871.00 |
| | ගැලපුම් දීමනාව | = රු. 9,651.00 |
| | ජීවන වියදම් දීමනාව | = රු. 7,800.00 |
| 2017 - | මූලික මාසික වැටුප | = රු. 33,728.00 |
| | ගැලපුම් දීමනාව | = රු. 4,568.00 |
| | ජීවන වියදම් දීමනාව | = රු. 7,800.00 |

03. *වයස් සීමාව.-* අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක බෞද්ධ සංස්කෘතිය පිළිබඳ I වැනි/ II වැනි පෙළ ගෞරව උපාධියක් ලබා තිබීම හා එම ක්ෂේත්‍රයන් හි ආචාර්ය හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම.

(ii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනීමක් ලබා තිබීම. අවම වශයෙන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

05. *සේවා කොන්දේසි.-* ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සහ 12 වගන්ති අදාළ වේ.

06. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව තනතුරට අදාළ රාජකාරි සම්බන්ධව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සමඟ සේවා ගිවිසුමකට එළඹිය යුතුය.

වසන්ත ඒකනායක,
ලේකම්,
බුද්ධශාසන අමාත්‍යාංශය.

09-946

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුර

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු 02ක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කළ අයදුම්පත් බත්තරමුල්ල, පොල්දූව පාරේ, අංක 306/72 දරන ස්ථානයේ පිහිටි විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණකාධිපති වෙත 2016 ඔක්තෝබර් 22 දිනට හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "නියෝජ්‍ය විගණකාධිපති තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

*සටහන*.- (i) අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(ii) විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණකාධිපති වෙත එවනු සඳහා තමන් පදිංචි රටට *නැතහොත්* ආසන්නම රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(iii) *වෛද්‍ය පරීක්ෂණ සහ යානපත්‍ර*.- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙක් වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු ය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානපත්‍ර වියදමත් එම අයදුම්කරු විසින්ම දැරිය යුතු ය.

2. *සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ පත්වූ දින සිට ඔබගේ මාසික ඉපැයීම් වලින් සියයට හතක් (7%) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවන ලෙස ඔබට නියම කෙරේ.

(ii) දැනටමත් රජයේ සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන අයෙක් නම් විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් එම තනතුරේ කොන්දේසිම තවදුරටත් බලපැවැත්වේ.

3. 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය - රු. 47,615-10 x 1335-8 x 1630-17 x 2170 - රු. 1,10,895 වේ. (SL-1-2016) මෙම තනතුරට අදාල වැටුප් පියවර රු. 80,515 වේ. එහෙත් වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ පරිදි වේ.

*සටහන* :- තෝරාගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳව ආයතන අධ්‍යක්ෂ ජනරාල් විමසා බලා ඉහත සඳහන් වැටුප් පරිමාණයේ සුදුසු පියවරක හෙතෙම තබනු ලැබේ.

4. බඳවා ගැනීමේ ක්‍රමය:- මෙම තනතුර පහත සඳහන් සුදුසුකම් ඇති තැනැත්තන් අතුරින් විගණකාධිපති ඇතුළු රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

මෙම කමිටුවේ අනෙකුත් සාමාජිකයින් දෙදෙනා විගණකාධිපතිගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ඇත.

5. *අවශ්‍ය සුදුසුකම්*.- සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :-

(*අ*) අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු බව,

(*ආ*) විශිෂ්ට චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව,

(*ඇ*) (i) ශ්‍රී ලංකාවේ හෝ එංගලන්තයේ සහ වේල්ස්හි වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි හෝ එක්සත් රාජධානියෙහි වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි හෝ එක්සත් රාජධානියෙහි සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයෙහි හෝ ඊට සමාන වෘත්තීය ආයතනයක යටත් පිරිසෙයින් ආශ්‍රිත සාමාජිකයෙකු විය යුතු බව.

(ii) එසේ වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් අනතුරුව අවුරුදු 08ක පළපුරුද්දක් ලබා ඇති බව.

එසේ වුව ද,

(i) රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ /සංස්ථා සේවයේ අයදුම්කරුවන් සම්බන්ධයෙන් මාණ්ඩලික ශ්‍රේණියක අවුරුදු 8ක පළපුරුද්දක් ලබා තිබේ නම් සුදුසුකම් ලැබීමෙන් අනතුරුව පළපුරුද්ද තිබිය යුතු කාලසීමාව අවුරුදු 4 දක්වා අඩු කරනු ලැබේ.

(ii) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ අවුරුදු 8ක සේවයක් ඇති ශ්‍රී ලංකා විගණන සේවයේ සාමාජිකයින් සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමෙන් අනතුරුව පළපුරුද්ද අවශ්‍ය නොවේ.

(මේ සම්බන්ධයෙන් සේවා කාලය ගණන් ගැනීමේ දී පූර්ණ වැටුප් සහිත, අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු සැළකිල්ලට ගනු නොලැබේ.) ;

(*ඈ*) 2016 ඔක්තෝබර් 22 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි බව (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ /සංස්ථා සේවයේ තනතුරු දරන්නන් කෙරෙහි මෙම වයස් සීමාව අදාළ නොවේ.).

6. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලක්ම හෝ ඉල්ලා සිටින විටෙක අයදුම්කරුවන් ඒවා ඉදිරිපත් කළ යුතු ය :-

(*අ*) උප්පැන්න සහතිකය
(*සැ.යු.*- බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.),
(*ආ*) අධ්‍යාපන, වෘත්තීය සහ අනිකුත් සුදුසුකම් පිළිබඳ සහතික,
(*ඇ*) පශ්චාත් වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද පිළිබඳ සහතික,
(*ඈ*) චරිතය පිළිබඳව සඳහන් වන මෑතක දී ලබාගත් සහතික දෙකක්,
(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ /සංස්ථා සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාල නොවේ),
(*ඉ*) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

*සටහන.*- (i) අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නොඇමිණිය යුතු ය.
(ii) ඉල්ලා සිටින විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට අසමත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

7. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත ඉදිරිපත් කළයුතු අතර මෙම කාර්යාලයේ කිසිම නිලධාරියෙකු නමට පෞද්ගලිකව නොඑවිය යුතු ය.

8. මෙම *ගැසට් පත්‍රයේ* I කොටසේ II (අ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් වන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි මෙම තනතුරට බඳවා ගැනීම සඳහා ද අදාල වේ.

9. අයදුම්පත් ලැබුණු බව අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත දී අපේක්ෂකයින් වෙත දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නොලැබුණහොත් ඒ බව මා වෙත වහාම දැන්විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. එම්. ගාමිණී විජේසිංහ,
විගණකාධිපති.

2016 සැප්තැම්බර් මස 06 වැනි දින,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල

**ආදර්ශ අයදුම් පත්‍රය**

***විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුර***

අංකය ....................................
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින් වාසගම *හෙවත්* අගට යෙදෙන නමට යටින් ඉරක් අඳින්න) :—————.

2. තැපැල් ලිපිනය :—————.

3. (*අ*) උපන්දිනය :
අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.

(*ආ*) 2016 ඔක්තෝබර් 22 දිනට වයස :
අවුරුදු :—————. මාස :—————. දින :—————.

4. ජාතිය :—————.
(*අ*) ලාංකිකයෙක්ද යන වග :—————.
(*ආ*) ලාංකිකයෙක් නම් පහත සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න :
(i) අයදුම්කරු :—————.
(ii) අයදුම්කරුගේ පියා :—————.
(iii) අයදුම්කරුගේ පියාගේ පියා :—————.

5. අධ්‍යාපන සුදුසුකම් :

| *විභාගය/උපාධිය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|
| | | |

6. වෘත්තීය සුදුසුකම් :

| *විස්තර* | *එම සුදුසුකම් ලබාගත් දිනයන්* |
|---|---|
| | |

7. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :
(අ) තනතුර :————.
(ආ) දෙපාර්තමේන්තුව/ආයතනය :————.
(ඇ) පත්වූ දිනය :————.
(ඈ) ස්ථිර ද/විශ්‍රාම වැටුප් සහිත ද/තාවකාලික ද නැතහොත් කොන්ත්‍රාත්තුවටද යන වග :————.
(ඉ) තනතුරෙහි ස්ථිර කර ඇද්ද යන වග :————.
(ඊ) වාර්ෂික වැටුප් පරිමාණය :————.
(උ) දැනට ලබන වාර්ෂික වැටුප :————.

8. වෘත්තීය සුදුසුකම් ලබා ගන්නා තෙක් මාණ්ඩලික ශ්‍රේණියෙහි රැකියාවන්හි නිරතවීම් පිළිබඳ විස්තර :

| *තනතුර සහ කාර්යයන්ගේ ස්වභාවය* | *දෙපාර්තමේන්තුව/ ආයතනය* | *සිට* | *දක්වා* | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|---|
| | | | | |

9. වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව නිරත වූ රැකියා පිළිබඳ විස්තර :

| *තනතුර සහ කාර්යයන්ගේ ස්වභාවය* | *දෙපාර්තමේන්තුව/ ආයතනය* | *සිට* | *දක්වා* | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|---|
| | | | | |

10. සාමාර්ථයක් ලබා ඇති ඉහළම විභාග :-
සිංහල :-
දෙමළ :-
ඉංග්‍රීසි :-

11. ඔබ ගැන කරුණු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.

(i) ..................................

(ii) ..................................

12. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *ආයතන ප්‍රධානියාගේ සහතිකය* : (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි.)

……………………………………මහතා/මහත්මිය/මෙනෙවියගේ අයදුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ස්ථිර/තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම මත ............................දින සිට සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

.......................................,
අමාත්‍යාංශ ලේකම්ගේ/
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
සංස්ථාවේ සභාපතිගේ
අත්සන.

දිනය :————.
තනතුර :————.
ආයතනය :————.

**ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාවේ 3.1 (අ) ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරට බඳවා ගැනීම සඳහා වන ලකුණු පරිපාටිය :**

1. *අතිරේක වෘත්තීය සුදුසුකම්* : උපරිම ලකුණු 25

(අ) මූලික සුදුසුකම් වලට අමතරව ගණකාධිකරණය හෝ විගණන ක්ෂේත්‍රයේ පූර්ණ වෘත්තීය සුදුසුකම් සඳහා එක් වෘත්තීය සුදුසුකමක් සඳහා ලකුණු 05 බැගින්) ලකුණු 10

(ආ) ඉහත ක්ෂේත්‍රයන්ට අමතර වෙනත් ක්ෂේත්‍රයක හෝ නීති ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු 10
(එක් වෘත්තීය සුදුසුකමක් සඳහා ලකුණු 05 බැගින්)

(ඇ) තොරතුරු තාක්ෂණ පිළිබඳ වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු 05
(පිළිගත් පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුයි)

2. අධ්‍යාපනික සුදුසුකම් : උපරිම ලකුණු 25

| | |
|---|---|
| ආචාර්ය උපාධිය | ලකුණු 25 |
| එම්.ෆිල් උපාධිය | ලකුණු 20 |
| පශ්චාත් උපාධි, එම්.එස්.සී./එම්.ඒ. | ලකුණු 18 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ලකුණු 15 |
| පන්ති සාමාර්ථයක් සහිත උපාධිය | ලකුණු 12 |
| විශේෂ උපාධිය | ලකුණු 10 |
| සාමාන්‍ය උපාධිය | ලකුණු 08 |
| ඩිප්ලෝමා | ලකුණු 05 |

(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදේ.)

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන්නේ ගණකාධිකරණය හෝ විගණන ක්ෂේත්‍රයට අදාළව නම් උපරිම සුදුසුකම් වලට අමතරව, තවත් ලකුණු 02ක් ලබාදේ.

03. පළපුරුද්ද: උපරිම ලකුණු 40
(අ) බාහිර අයදුම්කරුවන් සඳහා වන මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් වසර 08ක සේවා කාලයට පසු එළඹෙන සෑම වසරකටම ලකුණු 05 බැගින්
(ආ) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් වසර 04ක සේවා කාලයට පසු එළඹෙන සෑම වසරකට ලකුණු 05 බැගින්

(ඇ) විගණන සේවයේ නිලධාරීන් සඳහා මූලික සුදුසුකම් ලබා ගැනීමෙන් පසු එළඹෙන සෑම වසරකටම ලකුණු 05 බැගින්

(ඈ) යම් අයදුම්කරුවකු විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරියෙකු ලෙස සම්පූර්ණ කරන ලද වර්ෂයකට ලකුණු 04 බැගින්ද, විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු සම්පූර්ණ කරන ලද වර්ෂයකට ලකුණු 02 බැගින්ද ලකුණු දිය යුතුය.එනමුත් ද්වි ගණනය වැලැක්වීම සඳහා අයදුම්කරුවකුට එකම කාල පරිච්ඡේදයකට අදාලව (ඇ) ඡේදයේ යටතේත් දෙයාකාරයෙන්ම ලකුණු නොදිය යුතුය.

04. සම්මුඛ පරීක්ෂණය සඳහා — උපරිම ලකුණු 10
(විශේෂ සුදුසුකම් හා වෙනත් අදාළ කුසලතා සඳහා ලකුණු ලබාදෙනු ඇත.)

*සැ.යු.* : ලකුණු ලබාදීමේදී සලකා බලන සුදුසුකම් / කුසලතා සම්මුඛ පරීක්ෂණ උපලේඛනයේ සඳහන් කළ යුතුය.

09-876

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

**(ISO 9001 : 2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලත් ආයතනයකි)**

*නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය*

ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2016

(ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදරා මුද්‍රණ ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයෙකු වන්න.)

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම**
**Computer Typesetting and Layout Design**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

**පාඨමාලා කාලය : මාස 5 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල / ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,000**

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා කේෂ්ත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් කෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුමද පුහුණුවද ලබා දේ.

**පාඨමාලා කාලය : මාස 4 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි**

**පාඨමාලා ගාස්තුව : ආයතනික පාඨමාලාව : රු. 16,000 NVQ පාඨමාලාව රු. 20,500**

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office :**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳ-වද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද Ms office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

**පාඨමාලා කාලය : මාස 4 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 11,500**

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබාදේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයින්ට ද මෙම මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 4 - (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල /ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 16,000**

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනි වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබා දේ. පාසැල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන සහ චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 4 - (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල /ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 21,500**

**ත්‍රිමාණ සජීවිකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

**පාඨමාලා කාලය - මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 21,500**

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding and Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වනු ඇත.

**පාඨමාලා කාලය - මාස 07 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල පාඨමාලා ගාස්තුව - රු. 16,500**

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව -**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full Time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

**පාඨමාලා කාලය : මාස 14 (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 21,500**

**ආංකික පෙර මුද්‍රණය - DIGITAL PREPRESS**

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි යෙදී සිටින සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

**පාඨමාලා කාලය - වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 20,500**

**ඕෆ්සෙට් පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය - SHEET FED LITHOPRESS**

මෙම පාඨමාලාව තුළින් පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුළුල් අවබෝධයක් හා මනා ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මාස 8ක පමණ කාලයක් පුරා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම අර්ධකාලීන පාඨමාලාව න්‍යායාත්මක හා ප්‍රායෝගික පංති

වලින් සමන්විත වේ. මෙම පාඨමාලාව ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම මුද්‍රණ ක්ෂේත්‍රයට ඇතුළත් වීමට උනන්දුවක් දක්වන නවකයන්ට ද සුදුසු වන අයුරින් පාඨමාලා අන්තර්ගතය සම්පාදනය කොට ඇත.

**පාඨමාලා කාලය - මාස 08 - (අර්ධකාලීන)   මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව රු. - 16,500**

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - DESIGN FOR PRINT**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

**පාඨමාලා කාලය - වසර 01 යි (අර්ධ කාලීන)   මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව - රු. 13,500**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය.

ලේඛකාධිකාරි, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162, ඊමේල් : sliopreg@sltnet.lk
web : www.sliop.edu.lk

ශාඛා :
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ.
දුරකථනය : 066 2222172
ජංගම : 071 0554298

09-833

---

**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය**

**ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය**

**සිංහල/දෙමළ භාෂා දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීමේ ගුරුවරයෙකු වීම සඳහා මූලික පුහුණුවක් ලබා ගැනීමට කදිම අවස්ථාවක්**

**දෙවන භාෂා ඉගැන්වීම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - සිංහල/දෙමළ**

සිංහල/දෙමළ දෙවන භාෂා ඉගැන්වීමේ ගුරුවරු වශයෙන් පුහුණුවක් ලැබීමට උනන්දුවක් දක්වන පහත මූලික සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකිකයින්ගෙන් මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සිංහල/දෙමළ විෂයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව අ. පො. ස. (උ.පෙළ) විභාගය සමත්ව සිටීම.
02. වයස අවුරුදු 28ට අඩු වීම.

අ. පො. ස. (සා. පෙළ) විභාගයේ සිංහල හෝ දෙමළ දෙවන භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටීම අතිරේක සුදුසුකමකි.

දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ මූලික පුහුණුවක් ලබා දෙන මෙම සහතිකපත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලැබීම අප ආයතනය විසින් හඳුන්වා දීමට යෝජිත දෙවන භාෂා ඉගැන්වීම් පිළිබඳ උසස් ඩිප්ලෝමාවට ඇතුළත් වීමට සුදුසුකමකි.

තව ද, මෙම පාඨමාලාව සම්පූර්ණ කළ පසුව දක්ෂතා අනුව මෙම ආයතනයේ භාෂා පන්තිවල තාවකාලික භාෂා ගුරුවරයෙකු ලෙස ඉගැන්වීමට අවස්ථාව ලබා දීමට අපේක්ෂිතය.

එක් භාෂා මාධ්‍යයක පුහුණු පාඨමාලාවක් සඳහා ඇතුළත් විය හැකි උපරිම සංඛ්‍යාව 60 දෙනෙකි. එක් මාධ්‍යයකින් පාඨමාලා 02ක් මෙම වසරේදී පැවැත්වීමට අපේක්ෂිතය. අවශ්‍ය ප්‍රමාණයට වඩා අයදුම්පත් ලැබුණහොත් තෝරා ගැනීමේ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම වසරේදී ඇතුළත්වීමට අවස්ථාවක් නොලද සුදුසුකම් ඇති අයදුම්කරුවන් මීළඟ වසරේ පාඨමාලාවට බඳවාගනු ඇත.

සහතික පත්‍ර පාඨමාලාව කොළඹ දී පවත්වන ලබන අතර පාඨමාලාව පැය 120කින් සමන්විත වේ. එමෙන්ම මාස 02ක් තුළදී පැවැත්වීමට නියමිත හෙයින් එකී කාලය තුළ නේවාසික පහසුකම් සහභාගිකයන් විසින් සපයා ගත යුතු ය. පාඨමාලාව පවත්වන දිනවල දිවා ආහාර හා තේ පානය ආයතනය විසින් සපයනු ලබයි.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : 2016.09.30

ඔබ විසින් පිළියෙල කරගත් අයදුම් පත්‍රය (අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් සහිත සහතික පත්‍රවල පිටපත් සමඟ) පහත ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත බහාලන ලිපිකවරයේ වම්පස ''දෙවන භාෂා ඉගැන්වීම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,
අංක 40, බුත්ගමුව පාර,
රාජගිරිය.

09-951

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

*ආධුනිකයින් බඳවා ගැනීම - 2017 ජනවාරි*

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. *පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා* :

| | *පාඨමාලාවේ නම* | *ජාතික වෘත්තීය සුදුසුකම් ( NVQ)* | *කාලය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) | - | අවු. 03 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ. පො. ස. (සා. පෙළ.) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 6ක් සමත් වී තිබීම. |
| 02 | විදුලි කාර්මික ශිල්පී (විශේෂ) | 4 වන මට්ටම | අවු. 03 | |
| 03 | ඉදිකිරීම් සුපරීක්ෂක | 4 වන මට්ටම | අවු. 01 1/2 | |
| 04 | ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී | 4 වන මට්ටම | අවු. 02 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත්වීම. |
| 05 | යන්ත්‍ර කාර්මික ශිල්පී (විශේෂ) - (Machinist Special) | 4 වන මට්ටම | අවු. 03 | |
| 06 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු | 4 වන මට්ටම | අවු. 01 1/2 | |
| 07 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව - (ICT) | 4 වන මට්ටම | අවු. 01 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත්වීම සහ අංක 07, 08 සඳහා මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. |
| 08 | පරිගණක චිත්‍ර නිර්මාණ පාඨමාලාව | 4 වන මට්ටම | අවු. 01 1/2 | |
| 09 | පෑස්සුම් ශිල්පී (විශේෂ) - (Welder) | 4 වන මට්ටම | අවු. 03 | අවම වශයෙන් අ. පො. ස. (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම. |
| 10 | ජලනල කාර්මික ශිල්පී | 4 වන මට්ටම | අවු. 02 | |
| 11. | දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 4 වන මට්ටම | අවු. 02 | |
| 12. | මූලික පොත් බඳින්නා | - | අවු. 01 | අවම වශයෙන් 9 වන වසර දක්වා අධ්‍යාපනය ලැබීම. |

2. *වයස* :

2016.10.13 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය.

3. පුහුණුව පිළිබඳ විස්තර :

3.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේදී මූලික පුහුණුව ආයතනය තුලදී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේදී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වල කර්මාන්තශාලා වලට අනුයුක්ත කරනු ලැබේ.

ද්‍රව කාර්මික ශිල්පී හා පෑස්සුම් ශිල්පී වැනි කාර්මික ශිල්ප සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත. පෑස්සුම් ශිල්පී පාඨමාලාවේදී නවීන පෑස්සුම් ශිල්පී ක්‍රමද පුහුණු කරනු ලැබේ.
(MMA/GAS/TIG/MIG/MAG/PLASMA/Stud Welding, Destructive & Non Destructive testing methods)

04. තෝරා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

05. අයදුම්පත් එවිය යුතු ආකාරය :

5.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත් හෝ www.naita.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් 2016 ඔක්තෝබර් මස 13 වැනි දිනට පෙර ''අධ්‍යක්ෂ/විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ ''ආධුනිකයින් බඳවා ගැනීම 2017 - ජනවාරි'' යන්න සඳහන් කළ යුතුය.

5.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

5.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරණ අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

5.4 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

*කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව*

**ආධුනිකයින් බඳවා ගැනීම - 2017 ජනවාරි**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම් පත්‍රය (11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ)

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනවිය

02. මුලකුරු සමග නම :————.

03. ලිපිනය :————.

04. පදිංචිය : (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ii) දිස්ත්‍රික්කය :————.

05. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. උපන් දිනය :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම x ලකුණින් සළකුණු කරන්න.)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ. පො. ස. (උ. පෙළ) | | අ.පො. ස. (සා.පෙළ) | | 8 වන ශ්‍රේණිය | |

අ.පො.ස. (සා. පෙළ.) විභාග ප්‍රතිඵල :

| | *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො. ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල :

| | *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

| හදාරා ඇති පරිගණක පාඨමාලාවන් |
|---|
| |
| |
| |

09. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

1. :————.
2. :————.
3. :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09-792

---

**අධිකරණ අමාත්‍යාංශය**

කම්කරු විනිශ්චය සහා භාෂණ පරිවර්තක සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2016

කම්කරු විනිශ්චය සභා කාර්යාලවල භාෂණ පරිවර්තක සේවයේ III ශ්‍රේණියේ (සිංහල/දෙමළ) තනතුරු 03ක් සහ (සිංහල/ඉංග්‍රීසි) තනතුරු 04 ක් සඳහා පහත සුදුසුකම් සම්පූර්ණ කරන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **''ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12''** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ **''කම්කරු විනිශ්චය සභා කාර්යාලවල භාෂණ පරිවර්තක සේවයේ III ශ්‍රේණියේ (සිංහල/දෙමළ) /(සිංහල/ඉංග්‍රීසි) තනතුරු සඳහා බඳවා ගැනීම''** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.10.21 දින වේ.

*සටහන.*— ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින් පවත්වන ලිඛිත විභාගයක් හා වෘත්තීය පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියෙකු වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර 03 ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග වසරකට දෙවරක් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05 ක් තුළ දී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03 ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර 05 ක් ඇතුළත ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම් යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN-1-2016, රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු.45,540 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ.

ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු. 27,140 ක් වේ. එම චක්‍රලේඛයේ II වන උපලේඛනය අනුව වැටුප් ගෙවනු ලබයි.

04. *සුදුසුකම්* :

(i) අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය හා භාෂණ පරිවර්තනයට අදාළ භාෂාවන් දෙක ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම; සහ
අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.
(ii) වෘත්තීය සුදුසුකම් - අදාළ නොවේ
(iii) පළපුරුද්ද - අදාළ නොවේ

05. *වයස් සීමාව* :
අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු. 18 ට නොඅඩු, උපරිම අවු. 30 ට නොවැඩි විය යුතු ය.

06. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුයි.

08. *ලිඛිත පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්‍රමය* :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සිංහල/දෙමළ හෝ සිංහල/ඉංග්‍රීසි භාෂණ පරිවර්තනය | 100 | 40% |

09. *වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්‍රමය* :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සිංහල/දෙමළ හෝ සිංහල/ඉංග්‍රීසි භාෂණ පරිවර්තනය | 100 | 40% |

මූලික සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවන අතර, ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ දී වාචිකව භාෂාව පරිවර්තනය කිරීමේ හැකියාව මැන බැලේ.

10. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් වෘත්තීය පරීක්ෂණය පවත්වන දිනයේ ම මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ.

11. *සේවා කොන්දේසි* :

සෑම පත්වීමක්ම අමාත්‍ය මණ්ඩල තීරණවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද යටත් වේ.

12. *විභාග ගාස්තු* :
සෑම අපේක්ෂකයකු විසින් ම රු. 300 ක විභාග ගාස්තුවක් මහජන බැංකුව, නගර මධ්‍ය ශාඛාවෙහි ඇති ගිණුම් අංක 176-1-001-9-9025184 දරන අධිකරණ අමාත්‍යාංශයේ ගිණුමට බැර කළ යුතුය. විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

13. (i) ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22 - 29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර 1-12 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 13 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු නොලැබේ.

සැලකිය යුතුය :
ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(ii) රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා වල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතුය.

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික, රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2016 අගෝස්තු මස 31 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

අංකය :.......................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

| | |
|---|---|
| (සිංහල/දෙමළ) | |
| (සිංහල/ඉංග්‍රීසි) | |

***අධිකරණ අමාත්‍යාංශය***

*කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක තනතුර සඳහා අයදුම්පත්‍රය*

01\. (*අ*) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(*ආ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02\. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03\. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04\. දුරකථන අංකය :————.

05\. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06\. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07\. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

08\. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- වර්ෂ :————. මාස :————. දින :————.

09\. ජාතිය :————.

10\. විවාහක/අවිවාහක බව :————.

11\. අ.පො.ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල :

විභාග අංකය :————. විභාගයට පෙනී සිටි වර්ෂය :————.
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථය :————.
ගණිතය සඳහා සාමාර්ථය :————.

විෂයය :............... සාමාර්ථය :............... විෂයය :............... සාමාර්ථය :...............
විෂයය :............... සාමාර්ථය :............... විෂයය :............... සාමාර්ථය :...............
විෂයය :............... සාමාර්ථය :............... විෂයය :............... සාමාර්ථය :...............
විෂයය :............... සාමාර්ථය :............... විෂයය :............... සාමාර්ථය :...............

12\. අ.පො.ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල
විභාග අංකය :————. විභාගයට පෙනී සිටි වර්ෂය :————.

විෂයය :............... සාමාර්ථය :............... විෂයය :............... සාමාර්ථය :...............

විෂයය :............... සාමාර්ථය :............... විෂයය :............... සාමාර්ථය :...............

13. වෙනත් සුදුසුකම්
    (i) ————.
    (ii) ————.

14. භාෂා ප්‍රවීණතාව : (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න) :

| | *ඉතා හොඳයි* | *හොඳයි* | *සාමාන්‍යයි* | *දුර්වලයි* |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

*අයදුම්කරුගේ සහතිකය*

.............................වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................... මයා./මිය./මෙනවිය ....../.../... දින සිට ............ ආයතනයේ ......... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියකු/නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අදාළ *ගැසට්* නිවේදනය ප්‍රකාරව ඔහු/ඇය මේ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, *ගැසට් නිවේදනයෙහි* සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

නම :————.

තනතුර :————.

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

09-886

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.